# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1979 අංක 65 දරන
# කම්කරුවන්ගේ පරිපූරක දීමනා
# පනත

[සහතිකය සටහන් කළේ 1979 නොවැම්බර් මස 9 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1979 නොවැම්බර් මස 16 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : ශත 90 යි　　　　තැපැල් ගාස්තුව : ශත 25 යි

# 1979 අංක 65 දරන කම්කරුවන්ගේ පරිපූරක දීමනා පනත

[සහතිකය සටහන් කළේ 1979 නොවැම්බර් මස 9 වන දින]

එල්. ඩී.—ඕ. 55/79

**සේවායෝජකයන් විසින් පෞද්ගලික අංශයේ ඇතැම් වර්ගවල කම්කරුවන්ට පරිපූරක දීමනාවක් ගෙවීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1979 අංක 65 දරන කම්කරුවන්ගේ පරිපූරක දීමනා පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, (මෙහි මින් මතු "අදාළ දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 සැප්තැම්බර් මස පළමුවන දින එය ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය. *(කෙටි නාමය හා ක්‍රියාත්මක වන දිනය.)*

**2.** (1) මේ පනතේ කාර්ය සඳහා කොමසාරිස්වරයා නියම බලධරයා විය යුතු ය. *(නියම බලධරයා.)*

(2) මේ පනතින් නියම බලධරයා වෙත සතු කරනු ලැබූ හෝ නියම කරනු ලැබූ හෝ පවරනු ලැබූ යම් බලයක්, කර්තව්‍යයක් හෝ කාර්යයක් කම්කරු දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු වෙත ඒ බලධරයා විසින් පවරනු ලැබිය හැකි ය.

**3.** (1) අදාළ දින සිට, යම් කර්මාන්තයක, මාසයේ මුළු ඉපයීම් රුපියල් එක් දහස් පන්සියයක් නොඉක්මවන කම්කරුවකුගේ සෑම සේවායෝජකයකු විසින් ම පහත දැක්වෙන පදනම මත ගණන් බලනු ලැබූ ("පරිපූරක දීමනාව" යනුවෙන් මේ පනතෙහි සඳහන් කරනු ලබන) දීමනාවක් එක් එක් මාසය සම්බන්ධයෙන් ඔහු විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබූ ඒ සෑම කම්කරුවකුට ම ගෙවනු ලැබිය යුතු ය :— *(පරිපූරක දීමනාව ගෙවීම.)*

(අ) මාසික පදනමක් මත පාරිශ්‍රමිකය ගෙවනු ලබන කම්කරුවකු සම්බන්ධයෙන් වන විට, ගෙවිය යුතු දීමනාව, රුපියල් පණස් පහක මුදලක් විය යුතු ය :

ඒසේ වුව ද, ඒ කම්කරුවාට වැඩ පැවරීමට සේවායෝජකයාගේ අපොහොසත්වීමක් නොවන යම් හේතුවක් නිසා, යම් ලිඛිත නීතියකින් හෝ ගිවිසුමකින් හෝ නියමිත පරිදි වූ අවශ්‍ය දින ගණන වැඩ නොකරන කම්කරුවකු සම්බන්ධයෙන් වන විට, ඒ කම්කරුවාට ගෙවිය යුතු දීමනාව, මාසය තුළ ඔහු වැඩ කළ දින ගණනට ප්‍රමාණානුකූල විය යුතු ය. කෙසේ වුව ද, ඒ දීමනාව රුපියල් පණස් පහ නොඉක්මවිය යුතු ය ;

(ආ) දෛනික අනුප්‍රමාණයක් මත ගෙවනු ලබන කම්කරුවකු සම්බන්ධයෙන් වන විට, ගෙවිය යුතු දීමනාව, මාසය තුළ ඔහු වැඩ කර ඇති එක් එක් දිනය සඳහා රුපියල් දෙකයි ශත පණහක මුදලක් විය යුතු ය. කෙසේ වුව ද, ඒ මාසය සඳහා ගෙවිය යුතු මුළු දීමනාව රුපියල් පණස් පහ නොඉක්මවිය යුතු ය ; තව ද

ඒ 45535—14,000 (79/10)

(ඇ) කෑලි අනුප්‍රමාණයේ පදනම මත සේවයෙහි නියුක්ත කර ඇති කම්කරුවකු සම්බන්ධයෙන් වන විට, ගෙවිය යුතු දීමනාව, මාසය තුළ ඒ කෑලි අනුප්‍රමාණය අනුව ඔහුට ගෙවිය යුතු වේතනයෙන් සියයට දහයකට නොඅඩු විය යුතු ය. කෙසේ වුව ද, ඒ මාසය සඳහා ගෙවිය යුතු දීමනාව රුපියල් පණස් පහ නොඉක්මවිය යුතු ය.

(2) මාසය සඳහා මුළු ඉපයීම් රුපියල් එක් දහස් පන් සියයක් ඉක්මවන නමුත් රුපියල් එක් දහස් පන්සිය පණස්පහකට අඩු කම්කරුවකුගේ සෑම සේවායෝජකයකු විසින් ම, රුපියල් එක් දහස් පන්සිය පණස්පහ සහ ඒ කම්කරුවා විසින් ඒ මාසය සම්බන්ධයෙන් වැටුප හෝ වේතන වශයෙන් ලබන මුදල අතර ඇති වෙනසට සමාන මුදලක් එක් එක් මාසය වෙනුවෙන් ඒ කම්කරුවාට දීමනාව වශයෙන් ගෙවිය යුතු ය.

(3) පරිපූරක දීමනාවට සහ කොළඹ පාරිභෝගිකයින්ගේ මිල දර්ශකයට අනුකූලව තීරණය කරනු ලැබූ ජීවන වියදම් දීමනාවකට නැතහොත් පඩි පාලක සභා ආඥාපනත යටතේ විශේෂ දීමනාවකට හිමිකම් ඇති සෑම කම්කරුවකු ම, යම් මාසයක් සම්බන්ධයෙන් ඒ ජීවන වියදම් දීමනාව හෝ ඒ විශේෂ දීමනාව, ජීවන වියදම් දර්ශක යේ අංක 245.9 ට අනුකූලව තීරණය කරන ලද ජීවන වියදම් දීමනා වේ හෝ 1979 සැප්තැම්බර් මාසය සඳහා ගෙවනු ලැබූ විශේෂ දීමනාවේ සහ පරිපූරක දීමනාවේ සමස්තය ඉක්මවන්නේ නම් මිස, එකී ජීවන වියදම් දර්ශකයේ අංකයට අනුකූලව තීරණය කරනු ලැබූ මුදලට වැඩි වන යම් ජීවන වියදම් දීමනාවකට හෝ එකී සැප්තැම්බර් මාසය සඳහා ගෙවනු ලැබූ මුදලට වැඩි වන විශේෂ දීමනාවකට හෝ මෙම පනත බලපවත්නා තාක් කල් හිමිකම් නො ලැබිය යුතු ය. එසේ වුවහොත් පරිපූරක දීමනාවට අතිරේකව, එම මාසය සම්බන්ධයෙන් ඒ වැඩි ප්‍රමාණය ගෙවනු ලැබීමට ඒ කම්කරුවා හිමිකම් ලැබිය යුතු ය.

(4) පරිපූරක දීමනාවකට හිමිකම් ඇති කම්කරුවකු, යම් සාමූහික ගිවිසුමක විධිවිධාන අනුව හෝ විධිවිධාන පදනම් කොට ගෙන නැත හොත් කාර්මික ආරාවුල් පනතේ 10(2) වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ යම් නියමයක් ප්‍රකාර අනාවර්ත ජීවන වියදම් පාරිතෝෂිකයකට ද හිමිකම් ඇත්තා වූ නැතහොත් ඒ පාරිතෝෂිකය ගෙවීමට ඔහුගේ සේවායෝජකයා ස්වේච්ඡාවෙන් එකඟ වන්නා වූ අවස්ථාවක, ඒ ගිවිසුමෙහි හෝ නියමයෙහි පට හැනිව කුමක් සඳහන් වුව ද, මේ පනත බලපවත්නා තාක් කල් ඒ කම්කරුවා, පහත දැක්වෙන මුදල් ප්‍රමාණවලට වැඩි වන්නා වූ අනාවර්ත ජීවන වියදම් පාරිතෝෂිකයකට හිමිකම නොලැබිය යුතු ය:—

(අ) ජීවන වියදම් දර්ශක අංක 245.9 නොඉක්මවන අංකයක පවත්නා අවස්ථාවක, ඒ අංකයට අනුව තීරණය කරනු ලැබූ මුදල් ප්‍රමාණයක් ;

(ආ) ජීවන වියදම් දර්ශක අංක 245.9 ඉක්මවන, එහෙත් 273.4 නොඉක්මවන අවස්ථාවක, ජීවන වියදම් දර්ශක අංක 245.9 අනුව තීරණය කරනු ලැබූ මුදල් ප්‍රමාණයක් ; සහ

(ඇ) ජීවන වියදම් දර්ශක අංක 273.4 ඉක්මවන අංකයක පවත්නා අවස්ථාවක,—

(i) ඒ අංකය හා ජීවන වියදම් දර්ශක අංක 273.4 අතර ඇති වෙනස අනුව තීරණය කරනු ලැබූ මුදල් ප්‍රමාණයේ ; සහ

(ii) ජීවන වියදම් දර්ශක අංක 245.9 ට අනුව තීරණය කරනු ලැබූ මුදල් ප්‍රමාණයේ

සමස්තය.

වෙනත් යම් ලිඛිත නීති ආදියක කුමක් සඳහන් වුව ද මේ පනත වලංගු හා බල සහිත විය යුතු බව.

4. වෙනත් යම් ලිඛිත නීතියක හෝ වාචික වූ හෝ ලිඛිත වූ හෝ ප්‍රකාශිත වූ හෝ ගම්‍යමාන වූ හෝ යම් සාමූහික ගිවිසුමක හෝ වෙනත් ගිවිසුමක හෝ යම් සේවානියුක්ති ගිවිසුමක හෝ කුමක් සඳහන් වුව ද මේ පනතේ විධිවිධාන වලංගු හා බලසහිත විය යුතු ය; තව ද ඒ අනුව, ඒ විධිවිධාන සහ ඒ වෙනත් යම් නීතිය හෝ සාමූහික ගිවිසුම හෝ වෙනත් ගිවිසුම හෝ සේවානියුක්ති ගිවිසුම අතර යම් ගැටීමක් හෝ නොගැළපීමක් ඇති අවස්ථාවක, ඒ නොගැළපීමේ ප්‍රමාණය අනුව ඒ විධිවිධාන ඒ වෙනත් නීතිය, සාමූහික ගිවිසුම, වෙනත් ගිවිසුම හෝ සේවානියුක්ති ගිවිසුම අභිභවා, බලපැවැත්විය යුතු ය.

සේවානියුක්තිය නොකඩව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් විශේෂ විධිවිධාන.

5. 3 වන වගන්තියේ (3) වන හා (4) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, අදාළ දිනයට පෙරාතුව ම වූ දින යම් සේවා යෝජකයකු විසින් යම් කර්මාන්තයක සේවයෙහි නියුක්ත කරනු ලැබූ සෑම කම්කරුවකු ම, ඒ සේවායෝජකයාගේ කම්කරුවකු වශයෙන් ඔහු සේවය කරන තාක් කල්, අදාළ දිනයට පෙරාතුව ම වූ දිනයෙහි ඒ කම්කරුවා භුක්ති විඳිමින් සිටි, ඔහුට ගෙවනු ලැබූ (මේ පනත යටතේ ගෙවිය යුතු පරිපූරක දීමනාව නොමැතිව) වැටුප්වලට, දීමනාවලට හෝ කවර නාමයකින් හෝ අභිධානයකින් හඳුන්වනු ලබන මුදලින් කරන ලද වෙනත් ගෙවීම්වලට අදාළ නියම හා කොන්දේසිවලට නොඅඩු වාසි සහගත තත්ත්වයෙන් යුත් නියම හා කොන්දේසි මත ඒ සේවායෝජකයා විසින් එසේ නොකඩව සේවයෙහි නියුක්ත කරනු ලැබිය යුතු ය.

ලේඛන පවත්වාගෙන යාම සේවායෝජකයාගේ කාර්යය බව

6. (1) යම් කර්මාන්තයක කම්කරුවකුගේ සේවායෝජකයකු විසින්—

(අ) තමා විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබ ඇති එක් එක් කම්කරුවාගේ නම ;

(ආ) තමා විසින් සේවයෙහි නියුක්ත කර ඇති එක් එක් කම්කරුවා විසින් ඉටු කරනු ලබන වැඩයේ වර්ගය ; සහ

(ඇ) මේ පනතේ විධිවිධාන අනුව ඒ එක් එක් කම්කරුවාට ගෙවනු ලබන මුදල් ප්‍රමාණය

ඇක්වෙන ලේඛනයක්, ඒ කර්මාන්තය පවත්වාගෙන යනු ලබන් නේ යම් ස්ථානයක ද ඒ ස්ථානයෙහි තබා ගෙන පවත්වාගෙන යා යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ලේඛනයක් පවත්වාගෙන යන්නා වූ හෝ පවත්වාගෙන ගිය හෝ සෑම සේවායෝජකයකු විසින් ම, අදාළ දිනයෙන් ආරම්භ වන අවුරුදු හයක කාලයක් සඳහා ඒ ලේඛනය සුරක්ෂිතව තබා ගත යුතු අතර, පරීක්ෂා කිරීම සඳහා ඒ ලේඛනය ඉදිරිපත් කරන ලෙස හෝ ඒ ලේඛනයේ සත්‍ය පිටපතක් සපයන ලෙස හෝ එවැනි පිටපතක් සාදා ගැනීමට ඉඩ සලසන ලෙස හෝ නියම බලධරයා විසින් නියම කරනු ලැබූ විට, එසේ කළ යුතු ය.

නියම බලධරයාගේ බලතල.

7. නියම බලධරයාට—

(අ) යම් ලේඛනයක් පරීක්ෂා කිරීමේ හෝ මේ පනතේ විධිවිධාන අනුව ක්‍රියා කරනු ලැබේදැයි නිශ්චය කිරීමේ හෝ කාර්යය සඳහා යම් කර්මාන්තයක කම්කරුවන් සේවයෙහි නියුක්ත කරනු ලැබ සිටින යම් ස්ථානයකට දිවා හෝ රාත්‍රි කාලයේ සියලු යුක්තිසහගත වේලාවන්හි දී ඇතුළුවී ඒ ස්ථානය පරීක්ෂා කිරීමට ; හෝ

(ආ) තමා එම ස්ථානය පරීක්ෂා කරන විට, පරීක්ෂා කිරීම සඳහා එවැනි යම් ලේඛනයක් නොමැත්තේ නම්, ඒ ලේඛනය නියමිත පසු දිනයක දී පරීක්ෂා කිරීම සඳහා ඒ ස්ථානයේ දී හෝ ඒ බලධරයාගේ කාර්යාලයේ දී හෝ ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ; හෝ

(ඇ) එවැනි යම් ලේඛනයක සම්පූර්ණ හෝ එහි යම් කොටසක පිටපත් ගැනීමට ; හෝ

(ඈ) එම ස්ථානයේ සිටි තමන්ට දක්නට ලැබෙන්නා වූ ද ඒ ස්ථානයෙහි පවත්වාගෙන යනු ලබන යම් කර්මාන්තයක සේවයෙහි නියුක්ත කරනු ලැබ ඇති කම්කරුවන්ගේ සේවායෝජකයකු යයි විශ්වාස කිරීමට තමාට සාධාරණ හේතු ඇත්තා වූ ද යම් තැනැත්තකුගෙන් ප්‍රශ්න කිරීමට ; හෝ

(ඉ) යම් කර්මාන්තයක යෙදී සිටින කම්කරුවන්ගේ යම් සේවායෝජකයකුට—

(i) එවැනි යම් සේවායෝජකයකු විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබ සිටින සියලු කම්කරුවන්ට හෝ ඒ කම්කරුවන්ගෙන් සමන්විත යම් නිශ්චිත පන්තියකට හෝ වර්ගයකට අදාළ වන්නා වූ ද මේ පනතේ කාර්ය සඳහා තමා විසින් නියම කරනු ලබන වෙනත් යම් විස්තර ඇතුළත් වන්නා වූ ද වාර වාර්තාවක් ;

(ii) එවැනි යම් සේවායෝජකයකු විසින් සපයනු ලබන යම් වාර වාර්තාවක සඳහන් යම් විස්තර සම්බන්ධයෙන් තමා නියම කරනු ලබන ඒ තොරතුරු හෝ පැහැදිලි කිරීමක් ; හෝ

(iii) එවැනි යම් සේවායෝජකයකු විසින් පවත්වාගෙන යනු ලබන යම් ලේඛනයක සම්පූර්ණ හෝ එහි යම් කොටසක සත්‍ය පිටපතක්

නිශ්චිත දිනයක දී හෝ ඉන් පෙර තමා වෙත සපයන ලෙස ලියවිල්ලකින් විධාන කිරීමට

බලය තිබිය යුතු ය.

8. (අ) 6 වන වගන්තියේ විධිවිධානවලට අනුව ක්‍රියා කිරීම පැහැර හරින; හෝ — වැරදි හා දණ්ඩන.

(ආ) 7 වන වගන්තිය යටතේ නියම බලධරයාගේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා යම් ඇතුළුවීමක් හෝ පරීක්ෂා කිරීමක් පිණිස ඔහුට වුවමනා වන්නා වූ විධි සැලසීම පැහැර හරින; හෝ

(ඇ) එම වගන්තියෙන් පවරා ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී ඒ බලධරයාට බාධා කරන හෝ අවහිර කරන; හෝ

(ඈ) ඉදිරිපත් කරන ලෙස හෝ සපයන ලෙස ඒ බලධරයා තමාට නියම කරන යම් ලේඛනයක් ඉදිරිපත් කිරීම හෝ යම් තොරතුරක් සැපයීම ප්‍රතික්ෂේප කරන; හෝ

(ඉ) යම් වැදගත් කරුණක් සම්බන්ධයෙන් සාවද්‍ය වන්නා වූ යම් ප්‍රකාශයක් කරන හෝ කිරීමට සලස්වන නැතහොත් සාවද්‍ය ප්‍රකාශයක් අඩංගු යම් ලේඛනයක් එය සාවද්‍ය බව දැන දැන ම ඒ බලධරයා වෙත ඉදිරිපත් කරන හෝ ඉදිරිපත් කරනු ලැබීමට සලස්වන හෝ දැන දැනම ඉදිරිපත් කිරීමට ඉඩ හරින; හෝ

(ඊ) ඒ වගන්තියෙන් පවරන ලද බලතල යටතේ ක්‍රියා කරන ඒ බලධරයාට යම් තොරතුරක්, එය සාවද්‍ය බව දැන දැන ම සපයන; හෝ

(උ) 7 වන වගන්තිය යටතේ ඒ බලධරයා විසින් දෙනු ලැබූ යම් විධාන අනුව ක්‍රියා කිරීම පැහැර හරින හෝ ඒ වගන්තිය යටතේ වාර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබූ විට යම් සාවද්‍ය ප්‍රකාශයක් ඇතුළත් වාර වාර්තාවක් දැන දැන ම ඉදිරිපත් කරන හෝ සපයන හෝ ඉදිරිපත් කරනු ලැබීමට හෝ සපයනු ලැබීමට සලස්වන

සෑම තැනැත්තකු ම වරදක් කරන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ දී වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

මේ පනත යටතේ ලැබිය යුතු ගෙවීම කම්කරුවකුගේ වේතනවල කොටසක් විය යුතු බව.

9. (අ) සේවක අර්ථසාධක අරමුදලට සහ විශ්‍රාම වැටුපට දායක මුදල් ;

(ආ) වාර්ෂික නිවාඩු පාරිශ්‍රමිකය ;

(ඇ) අතිකාල පාරිශ්‍රමිකය ;

(ඈ) මාතෘ ආධාර ගෙවීම් ; සහ

(ඉ) ප්‍රසාද දීමනා සහ පැරිතෝෂික

ඇතුළත් මේ පනත යටතේ කම්කරුවකුට ගෙවිය යුතු පරිපූරක දීමනාව ඔහුගේ වේතනවල කොටසක් වන බව ලිඛිත නීතියේ සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව, කම්කරුවකුගේ සෑම සේවායෝජකයකු විසින් ම, ඒ කම්කරුවාගේ වේතන හෝ වැටුප් ගෙවීමට යම් ලිඛිත නීතියකින් ඒ සේවායෝජකයාට නියමිතව ඇත්තේ යම් කාලයක් ඇතුළත ද ඒ කාලය ඇතුළත ඒ පරිපූරක දීමනාව ගෙවනු ලැබිය යුතු ය.

කම්කරුවන්ට ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැරීම.

10. (1) මේ පනත යටතේ තමාගේ කම්කරුවකුට ගෙවිය යුතු ලෙස නියම කරනු ලැබ ඇති මුදලක් ගෙවීම පැහැර හරින නැතහොත් 5 වන වගන්තියේ හෝ 9 වන වගන්තියේ විධිවිධාන අනුව ක්‍රියා කිරීම පැහැර හරින යම් සේවායෝජකයකු වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ දී වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

(2) මේ පනත යටතේ යම් සේවායෝජකයකුගේ කම්කරුවකුට ගෙවිය යුතු ලෙස නියම කරනු ලැබ ඇති යම් මුදලක් ගෙවීම ඒ සේවායෝජකයා පැහැර හැරීම සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ දී ඔහු වරදකරු කරනු ලැබූ විට, ඒ වරද සඳහා අධිකරණය විසින් නියම කරනු ලැබිය හැකිව තිබූ වෙනත් යම් දණ්ඩනයකට අතිරේකව, ආඥාවෙහි සඳහන් කාලයක් ඇතුළත ඒ මුදල ඒ කම්කරුවාට ගෙවන ලෙස ඒ අධිකරණය විසින් ඒ සේවායෝජකයාට ආඥා කරනු ලැබිය හැකි ය. තව ද ඒ මුදල එසේ නොගෙවනු ලැබුවහොත්, එය අධිකරණය විසින් පනවනු ලැබූ දඩයක් මෙන් අධිකරණයේ ආඥාවක් මත ඒ මුදල අය කරගෙන ඒ කම්කරුවාට ගෙවනු ලැබිය යුතු ය.

ඇතැම් අවස්ථාවල කම්කරුවන්ට ලැබිය යුතු මුදල් අයකර ගැනීම.

11. (1) යම් සේවායෝජකයකුගේ කම්කරුවකුට, මේ පනත යටතේ ගෙවීමට නියමිත යම් මුදලක් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් ඒ සේවායෝජකයා වරදකරු කරනු ලැබ ඇති අවස්ථාවක, සේවායෝජකයා එසේ වරදකරු කරනු ලැබූ වරද පිළිබඳව අධිකරණය වෙත පැමිණිල්ල කළ දිනයට පෙරාතුව ම වූ අවුරුදු හය ඇතුළත, යම් අවස්ථාවක දී ඒ කම්කරුවාට හෝ වෙනත් යම් කම්කරුවකුට හෝ කම්කරුවන්ට මේ පනතේ විධිවිධානවලට අනුව ගෙවිය යුතු යම් මුදලක් සම්බන්ධයෙන් ඒ සේවායෝජක විසින් කරන ලද යම් පැහැර හැරීමක් පිළිබඳව සාක්ෂි ඉදිරිපත් කිරීමට අදහස් කරන

බවට නඩු විභාගය ආරම්භවීමට පෙර යම් අවස්ථාවක දී ඒ සේවා යෝජකයා වෙත, නියමිත ආකෘතියෙහි වූ දැන්වීමක් කර ඇත් නම්, එසේ සාක්ෂි දීම කළ හැකි අතර. පැහැර හැරීම ඔප්පු වූ විට, සේවා යෝජකගෙන් ඒ කම්කරුවාට හෝ කම්කරුවන්ට ලැබිය යුතු යයි අධිකරණයට පෙනී යන යම් මුදලක් ගෙවන ලෙස අධිකරණය විසින් ඒ සේවායෝජකයාට ආඥා කරනු ලැබිය හැකි ය. මේ උපවගන්තිය යටතේ ගෙවන ලෙස ආඥා කරනු ලැබූ යම් මුදලක් දඩයක් අයකර ගන්නා ආකාරයෙන් අයකර ගනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තියෙහි " නියමිත " යන්නෙන්, 12 වන වගන්තිය යටතේ සාදන ලද නියෝගවලින් නියමිත බව අදහස් වේ.

12. (1) මේ පනත යටතේ නියෝග සෑදීමට බලය දෙන ලද හෝ නියම කරන ලද කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, ඒ පළ කරන ලද දිනයේ දී හෝ නියෝගයෙහි සඳහන් යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම, එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එහි අනනුමතයේ දින සිට, එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොමැතිව, පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන්නේ යම් දිනයක ද ඒ දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

13. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි— අර්ථ නිරූපණය.

" ඉපයීම් " යන්නෙහි, 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය;

" කම්කරුවා " යන්නෙන්, යම් කර්මාන්තයක යම් වැඩක් වාචික වූ හෝ ලිඛිත වූ හෝ ප්‍රකාශිත වූ හෝ ගම්‍යමාන වූ හෝ ගිවිසුමක් යටතේ කිරීමට යම් සේවායෝජකයකු විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබ ඇති කවර වූ හෝ තත්ත්වයක තැනැත්තකු අදහස් වන අතර, එයට යම් ලිඛිත නීතියකින් හෝ අන්‍යාකාරයකින් වැටුප් හෝ වේතන විධිමත් කරනු ලැබූ කම්කරුවකු සහ කෑලි අනුප්‍රමාණයේ පදනමක් මත සේවයෙහි නියුක්ත කර ඇති කම්කරුවකු ඇතුළත් වන නමුත්, ගෘහ සේවකයකු හෝ සේවායෝජකයකුගේ පෞද්ගලික රියැදුරකු එයට ඇතුළත් නොවේ;

" කර්මාන්තය " යන්නට, සේවායෝජකයකු විසින් හෝ කම්කරුවකු විසින් හෝ පවත්වාගෙන යනු ලබන, ඉටු කරනු ලබන හෝ කරගෙන යනු ලබන යම් කාර්මික ව්‍යාපාරයක්,

වෙළෙඳ ව්‍යාපාරයක්, ව්‍යාපාරයක්, ව්‍යාපෘතියක්, වෘත්තියක් හෝ ජීවනෝපායක් සහ යම් කර්මාන්තයක යම් අංශයක් හෝ එබන්දක යම් කටයුත්තක් හෝ ක්‍රියාවලියක් ඇතුළත් වන නමුත් සමාගම් ආඥාපනත යටතේ හැර වෙනත් යම් ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ හෝ පිහිටු වන ලද්ද වූ හෝ පිහිටුවනු ලබන්නා වූ ද ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලින් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ ද සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් විසින් පවත්වාගෙන යනු ලබන යම් කාර්මික ව්‍යාපාරයක්, වෙළෙඳ ව්‍යාපාරයක් හෝ ව්‍යාපාරයක් ඇතුළත් නොවේ ;

“ කොමසාරිස්වරයා ” යන්නෙන්, තත් කාලයෙහි කම්කරු කොමසාරිස් ධුරය දරන තැනැත්තා අදහස් වන අතර, නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරයකු වශයෙන් හෝ ජ්‍යෙෂ්ඨ සහකාර කම්කරු කොමසාරිස්වරයකු වශයෙන් හෝ සහකාර කම්කරු කොමසාරිස්වරයකු වශයෙන් හෝ කම්කරු නිලධරයකු වශයෙන් හෝ තත් කාලයෙහි ධුරය දරන යම් තැනැත්තෙක් ද ඊට ඇතුළත් වේ ;

“ වැටුප් ” හෝ “ වේතන ” යන්නෙන්,—

(අ) කම්කරුවාගේ ගිවිසගත් වේතනය හෝ වැටුප නැතහොත් කම්කරුවා අයත් වන්නේ යම් කර්මාන්තයකට ද ඒ කර්මාන්තය සඳහා අදාළ පඩි පාලක සභාව විසින් නියමිත වේතනයෙහි හෝ වැටුපෙහි ;

(ආ) 1968 අංක 40 දරන සේවානියුක්තයින්ගේ අතුරු අවප්‍රමාණ කිරීමේ දීමනා පනත යටතේ කම්කරුවකුට ගෙවිය යුතු යම් මුදල් ප්‍රමාණයක ;

(ඇ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 1 දරන කම්කරුවන්ගේ අයවැය සහන දීමනා පනත යටතේ කම්කරුවකුට ගෙවිය යුතු යම් මුදල් ප්‍රමාණයක ;

(ඈ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 17 දරන කම්කරුවන්ගේ විශේෂ දීමනා පනත යටතේ කම්කරුවාට ගෙවිය යුතු යම් මුදල් ප්‍රමාණයක ;

(ඉ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 18 දරන කම්කරුවන්ගේ අයවැය සහන දීමනා (අංක 2) පනත යටතේ කම්කරුවකුට ගෙවිය යුතු යම් මුදල් ප්‍රමාණයක ; සහ

(ඊ) යම් සාමූහික ගිවිසුමක විධිවිධානවලට අනුව හෝ එය පදනම් කර ගෙන කම්කරුවකුට ගෙවිය යුතු යම් මුදල් ප්‍රමාණයක

සමස්තය අදහස් වේ ;

“ සාමූහික ගිවිසුම ” යන්නෙහි, කාර්මික ආරාවුල් පනතෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය ;

"සේවායෝජකයා" යන්නෙන්, යම් කර්මාන්තයක, තමා වෙනුවෙන් යම් කම්කරුවකු සේවයෙහි නියුක්ත කරන යම් තැනැත්තකු හෝ වෙනත් යම් තැනැත්තකු විසින් යම් කම්කරුවකු සේවයෙහි නියුක්ත කරනු ලබන්නේ යම් තැනැත්තකු වෙනුවෙන් ද ඒ තැනැත්තා හෝ අදහස් වන අතර, යම් කර්මාන්තයක වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් යම් කම්කරුවකු සේවයෙහි නියුක්ත කරනු ලබන්නේ යම් තැනැත්තකු විසින් ද ඒ තැනැත්තා ද ඊට ඇතුළත් වේ.